ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2020 මැයි මස 15 දින |

**විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2020 පෙබරවාරි**

## සමස්ත නිරීක්ෂණ

අපනයන ආදායම ඉහළ යෑමේ වේගයට වඩා වැඩි වේගයකින් ආනයන වියදම් ඉහළ යෑම හේතුවෙන් 2019 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව 2020 වසරේ පෙබරවාරි මාසයේ දී වෙළඳ හිඟය පුළුල් විය. පාස්කු ඉරු දින ප්‍රහාරවල බලපෑමෙන් අනතුරුව අපේක්ෂා කළ මට්ටමට වඩා වේගයෙන් යථා තත්ත්වයට පත් වූ සංචාරක කර්මාන්තය, 2020 වසරේ පෙබරවාරි මස අග සිට කොවිඩ්-19 (COVID-19) ව්‍යාප්ත වීම වසංගත තත්ත්වයක් බවට පත්වීමත් සමඟ, නැවත බලපෑමට ලක් විය. විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ 2020 වසරේ පෙබරවාරි මාසයේ දී පෙර වසරට සාපේක්ෂව වර්ධනයක් වාර්තා කළ අතර, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි සහ කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන ශුද්ධ ගෙවීම් වාර්තා කළේය. 2020 වසරේ මාර්තු මස දෙවන සතිය දක්වා සාපේක්ෂ ලෙස ස්ථාවරව පැවති ශ්‍රී ලංකා රුපියල, මාර්තු මස අග භාගයේ සිට 2020 වසරේ අප්‍රේල් මස මැද භාගය දක්වා සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වූ නමුත් ඉන් පසුව ස්ථාවර වෙමින්, 2020 වසරේ මැයි මස පළමු සතිය තුළ දී සැලකිය යුතු අතිප්‍රමාණය වීමක් වාර්තා කළේය. 2020 වසරේ මාර්තු මස සිට කොවිඩ්-19 වසංගතය හේතුවෙන් විශේෂයෙන් ම, භාණ්ඩ අපනයන, සංචාරක කර්මාන්තය, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සහ විදේශීය ආයෝජන යන අංශ ඇතුළුව, විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය සැලකිය යුතු බලපෑමකට ලක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.




ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් ‘මාසික වෙළඳ විවරණිකාව’ ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක. සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව https://www.cbsl.gov.lk/si/node/6181

**සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2019 පෙබ. එ.ජ.ඩො. මිලියන | 2020 පෙබ. එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2019 ජන.- පෙබ. එ.ජ.ඩො. මිලියන | 2020 ජන.- පෙබ. එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 981 | 988 | 0.7 | 2,019 | 1,993 | -1.3 |
| ආනයන | 1,432 | 1,562 | 9.1 | 3,088 | 3,298 | 6.8 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -451 | -574 | | -1,069 | -1,304 | |
| සංචාරක ඉපැයීම් | 475 (ආ) | 391 (ඇ) | -17.7 | 935 (ආ) | 822 (ඇ) | -12.2 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 500 | 527 | 5.4 | 1,046 | 1,108 | 6.0 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | -15 | -6 | | -29 | -22 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 235 | 89 | | 521 | 229 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | 95 | 20 | | 167 | 79 | |
| දිගුකාලීන ණය | 141 | 69 | | 354 | 150 | |
| සමස්ත ශේෂය | | | | -858 | 310 | |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2019 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2020 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.
(ඈ) ද්විතීයික සහ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.

## වෙළඳ හිඟය හා වෙළඳ මිල අනුපාතය

- **වෙළඳ ගිණුමේ හිඟය** 2019 වසරේ පෙබරවාරි මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 451ට සාපේක්ෂව 2020 වසරේ පෙබරවාරි මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 574ක් දක්වා පුළුල් වූ අතර, ඒ සඳහා අපනයන වැඩි වීමට වඩා වැඩි ප්‍රමාණයකින් ආනයන ඉහළ යෑම හේතුවිය. කෙසේ වෙතත්, 2020 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව 2020 වසරේ පෙබරවාරි මාසයේ දී වෙළඳ හිඟය අඩු විය. සමුච්චිත වශයෙන් සැලකූ විට, 2019 වසරේ පළමු මාස දෙක තුළ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 1,069ක් වූ වෙළඳ හිඟය 2020 වසරේ පළමු මාස දෙක තුළ දී එ.ජ.ඩොලර් මිලියන 1,304ක් දක්වා පුළුල් විය. වෙළඳ ගිණුමේ හිඟය පුළුල් වීම සඳහා බලපෑ ප්‍රධාන අයිතම රූප සටහන 1 මගින් දැක්වේ.

- මේ අතර, අපනයන හා ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන **වෙළඳ මිල අනුපාතය** 2020 වසරේ පෙබරවාරි මාසයේ දී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 3.5කින් පහත වැටුණු අතර, මේ සඳහා ආනයන මිල ගණන් පහළ යෑමේ වේගයට වඩා වැඩි වේගයකින් අපනයන මිල ගණන් පහළ යෑම හේතු විය.

**රූප සටහන 1: වෙළඳ හිඟය පුළුල් වීම සඳහා දායක වූ ප්‍රධාන අයිතම : 2020 ජනවාරි - පෙබරවාරි (එ.ජ. ඩොලර් මිලියන)**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ හිඟය (2019 – 2020)**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය (2019 – 2020)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය

- 2019 වසරේ ජූනි මාසයෙන් පසුව ප්‍රථම වරට වර්ධනයක් වාර්තා කරමින් 2020 වසරේ පෙබරවාරි මාසයේ දී **වෙළඳ භාණ්ඩ අපනයන** ආදායම එ.ජ. ඩොලර් මිලියන 988ක් දක්වා සියයට 0.7කින් ඉහළ ගිය අතර, කෘෂිකාර්මික සහ ඛනිජ අපනයන පහත වැටීම හමුවේ වුවද කාර්මික අපනයන ඉහළ යෑම ඒ සඳහා හේතු විය.
- 2019 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව 2020 වසරේ පෙබරවාරි මාසයේ දී **කාර්මික අපනයන** ආදායම සුළු වශයෙන් ඉහළ ගියේය. පෙර වසරේ පෙබරවාරි මාසය හා සසඳන විට 2020 වසරේ පෙබරවාරි මාසයේ දී ඛනිජ තෙල් නිෂ්පාදන අපනයන ආදායම කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, නැව් සහ ගුවන්යානා සඳහා යොදා ගනු ලබන ඉන්ධන අපනයන පරිමා සහ මිල ගණන් ඉහළ යෑම එයට උපකාරී විය. ඇමෙරිකා එක්සත් ජනපදය වෙතින් වූ ඇණවුම්

අපනයන ආදායම පහත වැටුණ ද, රෙදිපිළි හා අනෙකුත් නිමකළ රෙදිපිළි ද්‍රව්‍ය අපනයන ඉහළ යෑම හේතුවෙන් රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම සුළු වශයෙන් ඉහළ ගියේය. යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, රබර් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ වැනි වෙනත් ප්‍රධාන උප කාණ්ඩවල අපනයන ආදායම ද මාසය තුළ දී ඉහළ ගියේය. කෙසේ වුවද, 2019 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව මෙම මාසයේ දී මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, දැව හා කඩදාසි නිෂ්පාදිත, සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන්, මූල ලෝහ හා උපාංග, රසායනික නිෂ්පාදිත සහ ප්‍රවාහන උපකරණ අපනයන ආදායම පහත වැටුණි.

- 2020 වසරේ පෙබරවාරි මාසයේ දී **කෘෂිකාර්මික අපනයන** ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව පහත වැටුණි. 2020 වසරේ පෙබරවාරි මාසයේ දී කුළුබඩු සහ පොල් අපනයන ආදායම, අපනයන පරිමාව අඩු වීම හේතුවෙන් පහත වැටුණු අතර, සාමාන්‍ය අපනයන මිල ගණන් පහත වැටීම හේතුවෙන් තේ අපනයන ආදායම අඩු විය. ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා වෙළඳපොළ වෙතින් වූ ඉල්ලුම අඩු වීම හමුවේ 2020 වසරේ පෙබරවාරි මාසයේ දී මුහුදු ආහාර අපනයන ආදායම පහත වැටුණි. මෙයට වෙනස්ව යමින්, මෙම මාසයේ දී සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සහ ස්වභාවික රබර් අපනයන ආදායම කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය.
- පාෂාණ හා ගල් වර්ග අපනයන ආදායම පහත වැටීම හේතුවෙන් 2020 වසරේ පෙබරවාරි මාසයේ දී **ඛනිජ අපනයන** ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව පහත වැටුණි.
- 2020 වසරේ පෙබරවාරි මාසයේ දී අපනයන පරිමා දර්ශකය සියයට 5.2කින් ඉහළ ගිය අතර, අපනයන මිල දර්ශකය සියයට 4.2කින් පහත වැටුණි. මෙමගින් 2019 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව අපනයන ඉහළ යෑම සඳහා අපනයනය කරන ලද පරිමාව ඉහළ යෑම මුළුමනින් ම හේතුවූ බව පිළිබිඹු වේ.

**රූප සටහන 4: මාසික අපනයන ක්‍රියාකාරීත්වය**




මූලය: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: අපනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)**

| කාණ්ඩය | 2019 පෙබ. (එ.ජ. ඩොලර් මිලියන) | 2020 පෙබ. (එ.ජ. ඩොලර් මිලියන ) | වෙනස (%) | 2019 ජන.- පෙබ. (එ.ජ. ඩොලර් මිලියන) | 2020 ජන.- පෙබ. (එ.ජ. ඩොලර් මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **769.5** | **790.0** | **2.7** | **1,595.9** | **1,602.6** | **0.4** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 35.5 | 36.6 | 3.1 | 88.6 | 72.1 | -18.6 |
| සත්ත්ව ආහාර | 9.7 | 11.0 | 12.4 | 26.6 | 19.6 | -26.1 |
| රෙදිපිළි හා ඇඟලුම් | 465.6 | 468.1 | 0.5 | 941.5 | 942.2 | 0.1 |
| එයින් ඇඟලුම් | 434.0 | 433.7 | -0.1 | 878.5 | 869.8 | -1.0 |
| රෙදිපිළි | 23.3 | 25.1 | 7.6 | 46.3 | 52.4 | 13.1 |
| වෙනත් රෙදිපිළි සැකසුම් | 8.3 | 9.3 | 12.4 | 16.7 | 20.1 | 20.2 |
| රබර් නිෂ්පාදිත | 69.7 | 71.5 | 2.6 | 150.3 | 141.7 | -5.7 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 27.1 | 21.3 | -21.3 | 51.2 | 46.0 | -10.1 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 32.2 | 34.8 | 7.9 | 69.1 | 65.3 | -5.5 |
| ප්‍රවාහන උපකරණ | 7.2 | 6.9 | -3.9 | 16.1 | 14.1 | -11.9 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 38.6 | 57.8 | 50.0 | 76.0 | 140.6 | 84.9 |
| රසායනික නිෂ්පාදිත | 13.2 | 12.9 | -2.2 | 28.1 | 28.1 | 0.0 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 15.4 | 11.2 | -27.3 | 27.5 | 21.2 | -22.9 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 0.8 | 3.0 | 279.7 | 6.9 | 7.7 | 13.0 |
| සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 10.6 | 7.3 | -30.5 | 23.7 | 12.9 | -45.5 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 5.4 | 6.0 | 12.2 | 12.2 | 11.5 | -5.3 |
| මූල ලෝහ හා උපාංග | 15.2 | 12.1 | -20.7 | 29.3 | 24.8 | -15.4 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 2.4 | 2.6 | 12.2 | 4.8 | 4.8 | -0.1 |
| වෙනත් | 20.9 | 26.6 | 27.5 | 44.1 | 49.7 | 12.9 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **207.8** | **195.1** | **-6.1** | **415.4** | **383.8** | **-7.6** |
| තේ | 110.6 | 107.8 | -2.5 | 221.4 | 207.5 | -6.2 |
| රබර් | 2.3 | 3.1 | 34.4 | 5.1 | 5.8 | 13.8 |
| පොල් | 27.3 | 26.2 | -4.3 | 53.0 | 50.7 | -4.4 |
| කුළුබඩු | 28.6 | 18.7 | -34.7 | 56.4 | 38.1 | -32.4 |
| එළවළු | 2.5 | 2.4 | -4.5 | 5.1 | 5.0 | -2.4 |
| සකස් නොකළ දුම්කොළ | 1.9 | 1.7 | -6.8 | 4.0 | 3.4 | -15.5 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 9.3 | 14.7 | 58.4 | 17.7 | 29.0 | 64.4 |
| මුහුදු ආහාර | 25.3 | 20.6 | -18.8 | 52.7 | 44.2 | -16.1 |
| **3. ඛනිජ අපනයන** | **2.2** | **1.8** | **-15.2** | **4.6** | **3.9** | **-15.3** |
| **4. වර්ග නොකළ අපනයන** | **1.6** | **1.5** | **-10.8** | **3.4** | **3.0** | **-10.2** |
| **මුළු අපනයන** | **981.1** | **988.4** | **0.7** | **2,019.3** | **1,993.3** | **-1.3** |

(අ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය

- 2020 වසරේ පෙබරවාරි මාසයේ දී **වෙළඳ භාණ්ඩ ආනයන** වියදම 2020 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව පහළ ගියද, පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව අඛණ්ඩව තෙවැනි මාසයටත් ඉහළ ගියේය. ඒ අනුව, 2020 වසරේ පෙබරවාරි මාසයේ දී වෙළඳ භාණ්ඩ ආනයන එ.ජ. ඩොලර් මිලියන 1,562ක් දක්වා සියයට 9.1කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර ඒ සඳහා 2019 වසරේ පෙබරවාරි මාසයේ දී අඩු ආනයන වියදම් අගයක් වාර්තා වීමේ බලපෑම ද සමඟ පාරිභෝගික සහ අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම හේතු විය. කෙසේ වුවද, ඉන්ධන නොවන ආනයන වියදම අඩු වූ අතර ආනයන වියදම ඉහළ යෑමට ඉන්ධන ආනයන ප්‍රධාන වශයෙන් හේතු වූ බව එමගින් පිළිබිඹු වේ.
- 2020 වසරේ පෙබරවාරි මාසයේ දී **පාරිභෝගික භාණ්ඩ** ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව ඉහළ ගියේය. ආහාර හා පාන වර්ග යටතේ වර්ග කර ඇති කිරි නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන් කිරිපිටි), එළවළු (ප්‍රධාන වශයෙන් ලොකු ළූණු සහ අර්තාපල්), සීනි, කුළුබඩු (ප්‍රධාන වශයෙන් මිරිස්) සහ පාන වර්ග (ප්‍රධාන වශයෙන් මධ්‍යසාර සහිත පාන වර්ග) ආනයනය ඉහළ ගියේය. ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ යටතේ වර්ග කර ඇති පෞද්ගලික රථවාහන සහ වෙනත් උපකාණ්ඩ යටතේ වර්ග කර ඇති බොහෝ අයිතම සඳහා වූ ආනයන වියදම 2020 වසරේ පෙබරවාරි මාසයේ දී ඉහළ ගිය අතර, පෙර වසරේ අනුරූප මාසයේ දී එම කාණ්ඩයේ ආනයන වියදම් සාපේක්ෂව අඩු මට්ටමක පැවතීම මෙයට හේතු විය.
- 2020 වසරේ පෙබරවාරි මාසයේ දී **අන්තර් භාණ්ඩ** ආනයන වියදම ද පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව ඉහළ ගියේය. 2019 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව බොරතෙල්, පිරිපහදු කළ ඛනිජ තෙල් සහ ගල් අඟුරු ආනයන මිල ගණන් පහත වැටුණ ද එම අයිතමවල ආනයන පරිමාව ඉහළ යෑම මෙම මාසයේ දී ඉන්ධන ආනයන වියදම ඉහළ යෑම සඳහා හේතු විය. 2020 වසරේ පෙබරවාරි මාසයේ දී ආහාර සැකසුම් (ප්‍රධාන වශයෙන් පාම් තෙල්), රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත, පොහොර (ප්‍රධාන වශයෙන් යූරියා) සහ රසායනික නිෂ්පාදිත ආනයන ද ඉහළ ගියේය. කෙසේ වුව ද, ප්‍රධාන වශයෙන් කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් සැපයුම් දාමයේ ඇති වූ අවහිරතාවල ප්‍රතිඵලයක් ලෙස චීනයෙන් භාණ්ඩ ආනයනය කිරීම අඩු වීම නිසා රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම කැපී පෙනෙන ලෙස පහත වැටුණි.
- මේ අතර, 2019 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව 2020 වසරේ පෙබරවාරි මාසයේ දී **ආයෝජන භාණ්ඩ** ආනයන වියදම පහත වැටුණි. යන්ත්‍රසූත්‍ර හා උපකරණ කොටස් ආනයනය කැපී පෙනෙන ලෙස ඉහළ ගිය ද, යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම පහත වැටුණි. ප්‍රවාහන උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය ද පහත වැටුණි.
- 2020 වසරේ පෙබරවාරි මාසයේ දී ආනයන පරිමා දර්ශකය සියයට 10.0කින් ඉහළ ගිය අතර, ආනයන මිල දර්ශකය සියයට 0.8කින් පහත වැටුණි. 2019 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව ආනයන ඉහළ යෑම සඳහා ආනයනය කරන ලද පරිමාව ඉහළ යෑම මුළුමනින් ම හේතු වූ බව මෙමගින් පිළිබිඹු වේ.

**රූප සටහන 6: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: මාසික ආනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)**

| කාණ්ඩය | 2019 පෙබ. (එ.ජ. ඩොලර් මිලියන) | 2020 පෙබ. (එ.ජ. ඩොලර් මිලියන) | වෙනස (%) | 2019 ජන.- පෙබ. (එ.ජ. ඩොලර් මිලියන) | 2020 ජන.- පෙබ. (එ.ජ. ඩොලර් මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **259.9** | **327.3** | **25.9** | **560.4** | **699.0** | **24.7** |
| ආහාර හා පාන වර්ග | 85.7 | 135.8 | 58.5 | 196.9 | 283.4 | 43.9 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 3.2 | 4.5 | 41.6 | 7.1 | 9.9 | 39.1 |
| කිරි නිෂ්පාදිත | 6.1 | 28.0 | 359.4 | 24.0 | 64.3 | 168.3 |
| එයින් කිරිපිටි | 4.8 | 26.4 | 445.9 | 21.6 | 61.0 | 183.0 |
| එළවළු | 19.9 | 30.0 | 51.1 | 44.5 | 65.9 | 48.3 |
| මුහුදු ආහාර | 14.9 | 11.7 | -21.0 | 33.3 | 28.9 | -13.2 |
| සීනි හා රසකැවිලි | 13.9 | 25.8 | 85.4 | 28.9 | 45.8 | 58.8 |
| කුළුබඩු | 10.0 | 13.4 | 33.3 | 18.8 | 23.7 | 26.2 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 17.8 | 22.3 | 25.8 | 40.3 | 44.7 | 10.9 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 174.2 | 191.4 | 9.9 | 363.5 | 415.7 | 14.3 |
| පෞද්ගලික රථවාහන | 48.1 | 53.6 | 11.3 | 97.7 | 116.9 | 19.7 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 36.4 | 42.2 | 16.1 | 77.7 | 91.0 | 17.2 |
| ගෘහ උපකරණ | 15.4 | 19.7 | 27.9 | 29.7 | 39.7 | 33.6 |
| රෙදිපිළි හා උපාංග | 24.2 | 27.8 | 14.6 | 52.6 | 58.0 | 10.3 |
| විදුලි සන්දේශ මෙවලම් | 18.4 | 18.0 | -2.5 | 38.8 | 41.3 | 6.4 |
| ගෘහ හා දැව භාණ්ඩ | 11.4 | 13.2 | 15.4 | 24.8 | 31.0 | 25.0 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 20.3 | 17.1 | -15.7 | 42.4 | 37.8 | -10.7 |
| **2. අන්තර් භාණ්ඩ** | **831.0** | **911.5** | **9.7** | **1,787.1** | **1,846.0** | **3.3** |
| ඉන්ධන | 281.8 | 418.7 | 48.6 | 610.8 | 710.6 | 16.3 |
| එයින් බොරතෙල් | 48.0 | 93.4 | 94.9 | 135.8 | 140.3 | 3.4 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 201.5 | 289.4 | 43.7 | 387.5 | 496.6 | 28.2 |
| ගල් අඟුරු | 32.4 | 35.9 | 10.8 | 87.5 | 73.6 | -15.9 |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 16.4 | 6.3 | -61.3 | 32.9 | 20.2 | -38.5 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 212.2 | 182.0 | -14.2 | 474.7 | 482.8 | 1.7 |
| කඩදාසි හා ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 31.0 | 32.3 | 4.3 | 69.6 | 70.5 | 1.3 |
| කෘෂිකාර්මික යෙදවුම් | 12.6 | 15.7 | 24.7 | 27.8 | 36.3 | 30.7 |
| තිරිඟු හා ඉරිඟු | 26.7 | 8.4 | -68.5 | 41.2 | 17.3 | -58.0 |
| මූල ලෝහ | 59.4 | 20.4 | -65.6 | 106.1 | 45.6 | -57.0 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 43.3 | 45.2 | 4.2 | 96.3 | 94.9 | -1.5 |
| රසායනික නිෂ්පාදිත | 60.3 | 64.4 | 6.8 | 136.4 | 138.5 | 1.5 |
| පොහොර | 5.3 | 13.2 | 148.8 | 9.1 | 19.2 | 111.9 |
| රබර් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 16.0 | 24.3 | 52.0 | 35.6 | 46.9 | 31.6 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 66.0 | 80.5 | 21.9 | 146.6 | 163.1 | 11.3 |
| **3. ආයෝජන භාණ්ඩ** | **341.0** | **318.8** | **-6.5** | **739.5** | **747.0** | **1.0** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 193.9 | 183.5 | -5.4 | 425.1 | 442.1 | 4.0 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 108.8 | 102.5 | -5.8 | 240.8 | 221.8 | -7.9 |
| ප්‍රවාහන උපකරණ | 38.0 | 32.6 | -14.2 | 72.8 | 82.5 | 13.3 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.3 | 0.3 | 1.5 | 0.8 | 0.7 | -19.7 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.5** | **4.8** | **849.6** | **0.8** | **5.7** | **580.4** |
| **මුළු ආනයන** | **1,432.4** | **1,562.3** | **9.1** | **3,087.9** | **3,297.7** | **6.8** |
| **ඉන්ධන නොවන ආනයන** | **1,150.6** | **1,143.6** | **-0.6** | **2,477.1** | **2,587.1** | **4.4** |

(අ) තාවකාලික

මූලයන් : ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

- කොවිඩ්-19 වසංගතය සහ එය ගෝලීය වශයෙන් පැතිරීම 2020 පෙබරවාරි මාසයේ සිට ගෝලීය සංචාරක කර්මාන්තය කෙරෙහි සැලකිය යුතු ලෙස බලපෑවේය. ශ්‍රී ලංකාව ද මෙම ප්‍රවණතාවට මුහුණ දුන් අතර, **සංචාරක පැමිණීම්** 2019 පෙබරවාරි මාසයේ දී වාර්තා වූ 252,033 සිට 2020 පෙබරවාරි මාසයේ දී 207,507ක් දක්වා සියයට 17.7කින් අඩු විය. චීනයෙන් පැමිණි සංචාරකයින් ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩු වූ අතර, 2019 වසරේ පෙබරවාරි මාසයේ දී 28,039ක් ලෙස වාර්තා වූ චීන ජාතික සංචාරකයින්ගේ පැමිණීම 2020 පෙබරවාරි මාසයේ දී 2,096ක් පමණක් විය. 2020 පෙබරවාරි මාසයේ දී ප්‍රංශය, එක්සත් ජනපදය, කැනඩාව, එක්සත් රාජධානිය සහ ජර්මනිය වැනි ප්‍රධාන සංචාරක ගමනාන්තවලින් පැමිණි සංචාරකයින් පෙර වසරේ අනුරූප මාසය හා සසඳන විට අඩු වූ අතර, රුසියාව, පෝලන්තය සහ යුක්රේනය යන රටවලින් පැමිණි සංචාරකයින් ප්‍රමාණය වැඩි විය.
- මෙම ප්‍රවණතා සමඟ, **සංචාරක ඉපැයීම්** 2019 පෙබරවාරි මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 475 සමඟ සැසඳීමේ දී 2020 පෙබරවාරි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 391ක් දක්වා අඩු වී ඇතැයි තාවකාලිකව ඇස්තමේන්තු කර ඇති අතර, 2020 වසරේ පළමු මාස දෙක තුළ දී සමුච්චිත සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 822ක් විය. කොවිඩ්-19 වසංගතයෙහි බලපෑමත් සමඟ වසරේ ඉදිරි කාලය තුළ දී සංචාරක ඉපැයීම් දැඩි ලෙස බලපෑමට ලක්විය හැකිය.
- මේ අතර, 2020 පෙබරවාරි මාසයේදී, **විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ** එ.ජ. ඩොලර් මිලියන 527ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 5.4ක වැඩිවීමක් වාර්තා කළේය. සමුච්චිත පදනම මත, 2020 වසරේ පළමු මාස දෙක තුළ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,108ක් දක්වා සියයට 6.0කින් වැඩි විය. කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වීමෙන් ඉතාලිය, දකුණු කොරියාව සහ මැදපෙරදිග වැනි විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබෙන ප්‍රධාන ප්‍රභවයන්ට වසංගතයෙන් සිදු වන බලපෑම සහ එහි ප්‍රතිඵලයක් ලෙස ආර්ථිකයන් මන්දගාමී වීම සමඟ, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ඉදිරි මාසවලදී බලපෑමට ලක් විය හැකිය.

**රූප සටහන 8: සංචාරක පැමිණීම්හි ප්‍රධාන මූලාශ්‍ර**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 9: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**




මූලයන්: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූලය ලැබීම්

- 2020 වසරේ පෙබරවාරි මාසයේ දී රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි වූ විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 118ක ශුද්ධ ගෙවීමක් වාර්තා කිරීම හේතුවෙන්, සමුච්චිත පදනම මත, 2020 වසරේ පළමු මාස දෙක තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 99ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය.
- 2020 වසරේ පෙබරවාරි මාසයේ දී ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනුවලින් සමන්විත කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 6ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. සමුච්චිත පදනම මත, 2020 වසරේ පළමු මාස දෙක තුළ දී කොළඹ කොටස් වෙළඳපොළ එ.ජ. ඩොලර් මිලියන 22ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.
- විදේශීය ණය මුදාහැරීම් සහ ආපසු ගෙවීම් සමාන මට්ටම්වල පැවතීමත් සමඟ, 2020 වසරේ පෙබරවාරි මාසයේ දී රජය වෙත වූ දිගු කාලීන දළ ණය ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 69ක් වූ අතර, එමගින් රජය වෙත වූ දිගු කාලීන ණය එ.ජ. ඩොලර් මිලියන 0.4ක සුළු ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.

## ජාත්‍යන්තර සංචිත

- 2020 වසරේ පෙබරවාරි මාසයේ දී දළ නිළ සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 7.9ක් වූ අතර, එය ආනයනික මාස 4.7කට සමාන විය. දළ නිල සංචිත සහ බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත වන මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2020 වසරේ පෙබරවාරි මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 10.9ක් වූ අතර, එය ආනයනික මාස 6.5කට සමාන විය.

**රූප සටහන 10: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

- 2020 වසරේ මාර්තු මාසයේ මැද භාගය දක්වා ස්ථාවරව පැවති ශ්‍රී ලංකා රුපියල කොවිඩ්-19 වෛරසය පැතිරීමත් සමඟ ප්‍රධාන වශයෙන් වෙළඳපොළ තුළ පැවති අහිතකර සමපේක්ෂණ ගනුදෙනු හේතුවෙන් මාර්තු මස අග භාගයේ සිට අප්‍රේල් මැද දක්වා තියුණු ලෙස අවප්‍රමාණය විය. කෙසේ වුවත්, 2020 වසරේ මැයි මස පළමු සතිය තුළ දී සිදු වූ කැපීපෙනෙන අතිප්‍රමාණය වීමත් සමඟ විනිමය අනුපාතිකය ක්‍රමයෙන් ස්ථාවර විය. ඒ අනුව, 2020 වසරේ මැයි මස 15 වන දින වන විට රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 3.4කින් අවප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් 2020 වසරේ මැයි 15 දක්වා කාලපරිච්ඡේදය තුළ දී රුපියල, ජපන් යෙන්වලට සාපේක්ෂව අවප්‍රමාණය වූ අතර, යූරෝ, ස්ටර්ලින් පවුම, කැනේඩියානු ඩොලරය, ඕස්ට්‍රේලියානු ඩොලරය සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව අතිප්‍රමාණය විය.

**රූප සටහන 11: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2018 | 2019 | 2020 (මැයි 15 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | -16.4% | +0.6% | -3.4% |
| යූරෝ | -12.7% | +2.6% | +0.3% |
| ස්ටර්ලින් පවුම | -11.4% | -2.8% | +3.9% |
| ජපන් යෙන් | -18.1% | -1.0% | -4.6% |
| කැනේඩියානු ඩොලරය | -9.3% | -3.7% | +4.1% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -7.6% | +1.3% | +4.9% |
| ඉන්දියානු රුපියල | -8.7% | +2.6% | +2.2% |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව